# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,209 - 2021 ජනවාරි මස 01 වැනි සිකුරාදා - 2021.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | -- |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 7 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | -- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජනවාරි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1 - B 82091— 5,403 (2021/01)
F 1 -

# පළාත් සභා නිවේදන

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු සුසාන භූමි හා මිනීපිටි පිළිබඳ ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව **සුසාන භූමි හා මිනීපිටි** පිළිබඳ ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ නිසි බලධරයා වන බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ නිර්දේශය මත, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 02 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ආඥාපනතේ 5 වන වගන්තියෙන්, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස වෙන් කරන ලද පොදු සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීමට මෙයින් නියම කරමි.

රොෂාන් ගුණතිලක,
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී එෆ්අයිඑම් (ශ්‍රී ලංකා)
එන්ඩීසී පීඑස්සී මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස් ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

1. 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (1) වගන්තිය ප්‍රකාර පුස්සැල්ලේ වතුරාන පතිරයායෙගොඩැල්ල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

   බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඕපල්ල ගමෙහි L 17/64 දරන ක්ෂේත්‍ර කඩදාසියේ අ.ග.පි. 145 සැලැස්මෙහි පුස්සැල්ලේ වතුරාන පතිරයායෙගොඩැල්ල නැමැති ඉඩමේ බිම් කට්ටි අංක 83 A.

#### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරී වසම | : | 813 ඒ, ඉහල නාරගල |
| ගම | : | ඕපල්ල |
| ඉඩමේ නම | : | පුස්සැල්ලේ වතුරාන පතිරයායෙගොඩැල්ල |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | ප්‍රවේශ මාර්ගය සඳහා වූ රක්ෂිත බිම සහ අංක 163 දරන බිම් කට්ටිය |
| නැගෙනහිරට | : | අංක 170 දරන බිම් කට්ටිය |
| දකුණට | : | අංක 164 දරන බිම් කට්ටිය සහ ප්‍රවේශ මාර්ගය සඳහා වූ රක්ෂිත බිම |
| බස්නාහිරට | : | T. P. 296911 මායිම් වූ අක්කර 01, රූඩ් 0, පර්. 0 ක් වූ භූමිය |

2. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොබවක ගමෙහි ඇල් 22/8 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අවසාන ගම් පිඹුර 148 සැලැස්මෙහි රුක්වල්මුලුකන්ද මූකලාන නැමැති ඉඩමේ බිම් කට්ටි අංක 83.

#### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරී වසම | : | 813 C, ඉහල නාරගල දකුණ |
| ගම | : | කොබවක |
| ඉඩමේ නම | : | රුක්වල්මුලුකන්ද මූකලාන |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | T. P. 298935 සහ T.P. 277437 දරන හිමිකම් පිඹුරුවල ඉඩම් |
| නැගෙනහිරට | : | T. P. 278923 දරන හිමිකම් පිඹුරේ ඉඩම සහ අංක 96 දරන බිම් කට්ටිය |
| දකුණට | : | අංක 82 දරන බිම් කට්ටිය සහ 308262 දරන හිමිකම් පිඹුරේ ඉඩම |
| බස්නාහිරට | : | පාර සඳහා වූ රක්ෂිත බිම මායිම් වූ අක්කර 2 රූඩ් 0 පර්චස් 13ක් වූ භූමිය |

3. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රැටියල ගමෙහි අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 141 සැලැස්මෙහි අලිකාහේන නමැති ඉඩමෙහි බිම් කට්ටි අංක 273.

## උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : | 814ඒ, රැටියල |
| ගම | : | රැටියල |
| ඉඩමේ නම | : | අලිකාහේන |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 270 සහ 272 දරන බිම් කට්ටි |
| නැගෙනහිරට | : | පාර දිගට ඇති රක්ෂිත බිම |
| දකුණට | : | අංක 339 දරන බිම් කට්ටිය |
| බස්නාහිරට | : | අංක 338, 269 සහ 270 දරන බිම් කට්ටි මායිම් වූ අක්කර 0 රූඩ් 2 පර්චස් 24ක් වූ භූමිය |

4. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියකඩුව ගමෙහි අංක 03 පත්‍රයෙහි අ.ග.පි. 136 සැලැස්මෙහි කලුවලගොඩැල්ල නමැති ඉඩමේ බිම් කට්ටි අංක 366 සහ 370.

## උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : | 820, දීයකඩුව නැගෙනහිර |
| ගම | : | දීයකඩුව |
| ඉඩමේ නම | : | කලුවලගොඩැල්ල |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | බිම් කැබලි අංක 202 |
| නැගෙනහිරට | : | බිම් කැබලි අංක 202 සහ 201 |
| දකුණට | : | බිම් කැබලි අංක 201 සහ 198 |
| බස්නාහිරට | : | බිම් කැබලි අංක 365 හා පාර මායිම් වූ අක්කර 0, රූඩ් 3, පර්. 13ක් වූ භූමිය |

5. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දීයකඩුව ගමෙහි අංක 03 පත්‍රයෙහි අ.ග.පි. 136 සැලැස්මෙහි කබරගලකන්දෙකැලේ නමැති ඉඩමේ බිම් කට්ටි අංක 362.

## උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : | 820ඒ, දීයකඩුව බටහිර |
| ගම | : | දීයකඩුව |
| ඉඩමේ නම | : | කබරගලකන්දෙකැලේ |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | මහා මාර්ගය දිගේ වෙන්කල ඉඩම |
| නැගෙනහිරට | : | බිම් කැබලි අංක 363 |
| දකුණට | : | බිම් කැබලි අංක 149 E |
| බස්නාහිරට | : | බිම් කැබලි අංක 149 මායිම් වූ අක්කර 0, රූඩ් 3, පර්. 06ක් වූ භූමිය |

6. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගෝවින්න ගමෙහි ඇල් 22/16 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 467 දරන මූලික සැලැස්මෙහි මහයාය නමැති ඉඩමෙහි බිම් කට්ටි අංක 02.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : | 814, ගෝවින්න දකුණ |
| ගම | : | ගෝවින්න |
| ඉඩමේ නම | : | මහයාය |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | පාර දිගට ඇති රක්ෂිත බිම - ශ්‍රී ලංකා ජනරජයට අයිති මහයාය (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඩබ්. බාරොන් පෙරේරාට බදු දී ඇත. බලපත්‍ර අංකය නොමැත.) |
| නැගෙනහිරට | : | ශ්‍රී ලංකා ජනරජයට අයිති මහයාය (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඩබ්. ලේයාස් සිංඤෝට බදු දී ඇත. බලපත්‍ර අංකය නොමැත.) |
| දකුණට | : | ශ්‍රී ලංකා ජනරජයට අයිති මහයාය (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ එල්. එල්. කරෝලිස්ට බදු දී ඇත. බලපත්‍ර අංකය නොමැත.) |
| බස්නාහිරට | : | ශ්‍රී ලංකා ජනරජයට අයිති මහයාය (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ එම්. පොඩි අප්පුට බදු දී ඇත. බලපත්‍ර අංකය නොමැත.) සහ ශ්‍රී ලංකා ජනරජයට අයිති මහයාය (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඩී. බී. කලංසූරියට බදු දී ඇත. (බලපත්‍ර අංකය නොමැත.) මායිම් වූ රූඩ් 01, පර්. 33.6ක් වූ භූමිය. |

7. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බුලත්සිංහල ගමෙහි අංක 02 ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 140 සැලැස්මෙහි තිබ්බොට්ටා කැලේ නමැති ඉඩමේ බිම් කට්ටි අංක 699.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : | 824 F කරල් දැක්ම |
| ගම | : | බුලත්සිංහල |
| ඉඩමේ නම | : | තිබ්බොට්ටා කැලේ |

*මායිම් :*

සියලුම මායිම් සඳහා ලොට් අංක 700 මායිම් වූ අක්කර 0, රූඩ් 03, පර්. 39 ක් වූ භූමිය.

8. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහළ නාරගල ගමෙහි අංක L 22/7 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 143 සැලැස්මෙහි දියපොර ඇල්ලේ කන්ද නමැති ඉඩමෙහි බිම් කට්ටි අංක 77 A.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : | 812, පහල නාරගල |
| ගම | : | පහල නාරගල |
| ඉඩමේ නම | : | දියපොරඇල්ලේ කන්ද |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 282 සහ 281 දරන බිම් කට්ටිය |
| නැගෙනහිරට | : | අංක 281 දරන බිම් කට්ටිය |
| දකුණට | : | අංක 283 දරන බිම් කට්ටිය |
| බස්නාහිරට | : | අංක 282 දරන බිම් කට්ටිය මායිම් වූ අක්කර 0, රූඩ් 3, පර්. 01ක් වූ භූමිය |

9. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුඩලිගම ගමෙහි අංක L/23/49 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 139 සැලැස්මෙහි තැන්නපිටහේන නමැති ඉඩමෙහි බිම් කට්ටි අංක 189 A.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරී වසම | : | 817 ඒ, පහල කුඩලිගම |
| ගම | : | කුඩලිගම |
| ඉඩමේ නම | : | තැන්නපිටහේන |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | 294328 සහ 288293 දරන හිමිකම් පිඹුරුවල ඉඩම් |
| නැගෙනහිරට | : | 288293 දරන හිමිකම් පිඹුරෙහි ඉඩම සහ 189 දරන බිම් කට්ටිය |
| දකුණට | : | 189 දරන බිම් කට්ටිය සහ 348099 දරන හිමිකම් පිඹුරේ ඉඩම |
| බස්නාහිරට | : | 348099 සහ 294328 දරන හිමිකම් පිඹුරුවල ඉඩම් මායිම් වූ අක්කර 1, රූඩ් 3, පර්. 34ක් වූ භූමිය |

10. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉහල නාරගල ගමෙහි අංක 3 ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 144 සැලැස්මෙහි ඉත්තගලකන්ද නමැති ඉඩමෙහි බිම් කට්ටි අංක 304.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරී වසම | : | 813, ඉහළ නාරගල |
| ගම | : | ඉහළ නාරගල |
| ඉඩමේ නම | : | ඉත්තගල කන්ද |

*මායිම් :*

| | | |
|---|---|---|
| උතුරට | : | 253 වැනි බිම් කට්ටිය |
| නැගෙනහිරට | : | 298 වැනි බිම් කට්ටිය |
| දකුණට | : | ප්‍රවේශ මාර්ගය සඳහා වූ රක්ෂිත බිම |
| බස්නාහිරට | : | 253 1/2 වැනි බිම් කට්ටිය සහ ප්‍රවේශ මාර්ගය මායිම් වූ අක්. 0, රූ. 03, පර්. 4ක් වූ භූමිය. |

11. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහගම උතුර ගමෙහි අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 135 සැලැස්මෙහි ලුණුකොටු කන්ද නමැති ඉඩමේ බිම් කට්ටි අංක 468.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරී වසම | : | 819 ඊ, දෙමෝදර වත්ත |
| ගම | : | මහගම උතුර |
| ඉඩමේ නම | : | ලුණුකොටු කන්ද |

*මායිම් :*

| | |
|---|---|
| උතුරට | : 467 දරන බිම් කට්ටිය |
| නැගෙනහිරට | : 467 දරන බිම් කට්ටිය |
| දකුණට | : 467 දරන බිම් කට්ටිය |
| බස්නාහිරට | : පාර මායිම් වූ අක්. 01, රූ. 0, පර්. 0ක් වූ ඉඩම. |

12. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහගම දකුණ ගමෙහි අංක 05 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 134 සැලැස්මෙහි දුනුගස්දෙනියෙ කැලේ නමැති ඉඩමේ බිම් කට්ටි අංක 681.

**උපලේඛනය**

| | |
|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : 819සී, පොලේගොඩ බටහිර |
| ගම | : මහගම දකුණ |
| ඉඩමේ නම | : දුනුගස්දෙනියෙ කැලේ |

මායිම් :

| | |
|---|---|
| උතුරට | : මහගම උතුර ගම් මායිම සහ T.P. 289458 |
| නැගෙනහිරට | : අංක 682 දරන බිම් කට්ටිය |
| දකුණට | : අංක 682 දරන බිම් කට්ටිය |
| බස්නාහිරට | : අංක 02 දරන බිම් කට්ටිය මායිම් වූ අක්. 01, රූ. 0, පර්. 02 ක් වූ භූමිය. |

13. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හල්වතුර ගමෙහි අංක එල් 18/51, 52, 59 දරන ක්ෂේත්‍ර පත්‍රවල අංක A 2183 දරන මූලික සැලැස්මෙහි දුම්මලහේන නමැති ඉඩමේ බිම් කට්ටි අංක 87.

**උපලේඛනය**

| | |
|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : බුලත්සිංහල |
| ග්‍රාම නිලධාරි වසම | : 822 හල්වතුර |
| ගම | : හල්වතුර |
| ඉඩමේ නම | : දුම්මලහේන |

*මායිම් :*

| | |
|---|---|
| උතුරට | : සීමාසහිත ඇන්ගලෝ - ඇමරිකන් ඩිරෙක්ට් ට්‍රේඩින් කම්පැණිය විසින් අයිතිවාසිකම් කියන ලද හල්වතුර වත්ත |
| නැගෙනහිරට | : අංක 30 දරන බිම් කට්ටිය |
| දකුණට | : ප්‍රවේශ මාර්ගය සඳහා වූ රක්ෂිත බිම සහ අංක 88 දරන බිම් කට්ටිය |
| බස්නාහිරට | : අංක 28 දරන බිම් කට්ටිය මායිම් වූ අක්. 01, රූ. 0, පර්. 03 ක් වූ භූමිය |

01-373

# තනතුරු - ඇබෑර්තු

**බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම - 2021**

බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2021.02.01 දිනට හෝ ඊට පෙර **''ලේකම්, බඳවා ගැනීම් ශාඛාව, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය''** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තව ද, අයදුම්පතෙහි මාතෘකාව සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම - 2021''** ලෙස හා අයදුම් කරනු ලබන විෂයය හා මාධ්‍යය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු ය.

(*උදා.*-''බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේ දී උපාධිධාරීන් බඳවා ගැනීම - 2021'' - භූගෝල විද්‍යාව - සිංහල මාධ්‍යය'')

*සටහන* 1.- අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1 අයදුම්කරුවන් මෙම නිවේදනයේ 5.1 හි සඳහන් සුදුසුකම් සමග 5.2 හා 5.3 හි සඳහන් සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙහි සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව කුසලතාවය මැන බැලීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ 9.2 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ඇත. අයදුම්කරු විසින් ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණු වල ප්‍රමුඛතාවය පදනම් කරගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.3 මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ පළාත් පදනම මත වන අතර ඉල්ලුම් කළ හැකි දූනට පවතින පුරප්පාඩු හා මාධ්‍යය පිළිබඳ විස්තර පහත පරිදි වේ :

| *අනු අංකය* | *ඉල්ලුම් කළ හැකි විෂයයන්* | *සිංහල මාධ්‍යය* | *දෙමළ මාධ්‍යය* | *ඉංග්‍රීසි මාධ්‍යය* |
|---|---|---|---|---|
| 1 | ප්‍රාථමික | ✓ | ✓ | |
| 2 | ගණිතය | ✓ | ✓ | |
| 3 | විද්‍යාව | ✓ | ✓ | |
| 4 | සිංහල භාෂාව | ✓ | | |
| 5 | ඉංග්‍රීසි භාෂාව | | | ✓ |
| 6 | දෙමළ භාෂාව | | ✓ | |
| 7 | බුද්ධ ධර්මය | ✓ | | |
| 8 | ඉස්ලාම් ධර්මය | ✓ | ✓ | |
| 9 | කතෝලික ධර්මය | ✓ | ✓ | |
| 10 | හින්දු සංස්කෘතිය | | ✓ | |

| අනු අංකය | ඉල්ලුම් කළ හැකි විෂයයන් | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
|---|---|---|---|---|
| 11 | භූගෝල විද්‍යාව | ✓ | ✓ | |
| 12 | දේශපාලන විද්‍යාව | ✓ | ✓ | |
| 13 | තොරතුරු තාක්ෂණය | ✓ | ✓ | |
| 14 | ඉතිහාසය | ✓ | ✓ | |
| 15 | නාට්‍ය හා රංගකලාව | ✓ | ✓ | |
| 16 | පුරවැසි අධ්‍යයනය | ✓ | ✓ | |
| 17 | විශේෂ අධ්‍යාපනය | ✓ | ✓ | |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුරු ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

ii. උසස්වීම් බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතේ සිදු කරනු ඇත.

iii. අයදුම්කරුවන් තම උපාධියට අදාළ විෂයයන් යටතේ අයදුම් කළ යුතු අතර, පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා හෝ වෙනස් කරනු නොලැබේ.

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.06.20 දිනැතිව අනුමත කරන ලද බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදු කරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම් වලට අදළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව GE-02-2016 හි රු. 33,300-495x5-680x5-825x7-1,335x20-රු. 71,650/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. ඔවුන් මෙම වැටුප් පරිමාණයෙහි 3 වන පියවර වන රු. 34,290/- පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින්කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන සුදුසුකම්.-*

බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

5.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධියක්,

*සහ*

5.2 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී මව්බස හා ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමග විෂයයන් 06ක් සමත් වීම (අවම වශයෙන් එක් අවස්ථාවක දී විෂයයන් 05ක් සමත් වී තිබිය යුතුය.)

*සහ*

5.3 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එක් වරක දී විෂයයන් තුනක් සමත් වීම

06. *වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 35 නොඉක්මවිය යුතු ය. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන සුදුසුකම් සහිත උපාධිධාරීන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

(''ඒ අනුව **1986.02.01** දින හෝ ඊට පසු හා **2003.02.01** දින හෝ ඊට පෙර උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.'')

07. *අනෙකුත් අවශ්‍යතා.-*

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
iv. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට පූර්වාසන්න වසර 03ක බස්නාහිර පළාතේ ස්ථිර අඛණ්ඩ පදිංචිය තිබීම.

*හෝ*

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට අයදුම්කරු බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සහ කලත්‍රයා පූර්වාසන්න වසර 03 ක බස්නාහිර පළාතේ ස්ථිර අඛණ්ඩ පදිංචිය තිබිය යුතු ය.

v. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

08. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

8.1 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A 4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතු ය. 1.0 සිට 4.2 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේ ද 5.0 සිට ශීර්ෂ අනිකුත් පිටුවලට ද ඇතුළත් වන පරිදි තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත ගැසට් නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

8.3 අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොව අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ රු. 498,960/-ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.4 පුරප්පාඩුව සඳහා ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන විෂයය හා භාෂා මාධ්‍යය පසු අවස්ථාවලදී වෙනස් කිරීම කිසිසේත්ම සිදු කිරීම කළ නොහැකි අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

(ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන විෂයය හා මාධ්‍යය පදනම් කර ගනිමින් ඔබ වෙත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා පත්වීම් ලබා දීම සිදු කරනු ලබන බවත්, අයදුම් කරන අවස්ථාවේ දී අදාළ විෂයය හා මාධ්‍යය පිළිබඳ සැලකිලිමත් වන ලෙසත් එය පසුකාලීනව වෙනස් කරනු නොලබන බවත් වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.)

8.5 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *සම්මුඛ පරීක්ෂණය.-*

9.1 සාමාන්‍ය *සම්මුඛ පරීක්ෂණය* - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

සටහන 2 : ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

9.2 ප්‍රායෝගික පරීක්ෂණය.-

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| *අනු. අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | |

*සටහන 3 :-* ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු.-

ගුරු වෘත්තියේදී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

9.2.1 *ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය.-*

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි පහ (05)කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
ii. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 02 බැගින් ලබා ගත යුතුය.
iv. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

9.2.2. *නිර්ණායකයන්හි අරමුණු.-*

i. අරමුණ හා ප්‍රවිශ්ට වීම
සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

ii. පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේදී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

iii. සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම

iv. කාල කලමනාකරණය
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම

v. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

10. *අයදුම්පත පිරවීම සඳහා උපදෙස්.-*

අයදුම්පත පිරවීමේදී පහත උපලේඛනය හා ඡේද අංක 2.3 හි සඳහන් කරුණු භාවිතා කරන්න.

**උපලේඛනය 01**

| *භාෂා මාධ්‍යය* | *කේත අංකය* |
|---|---|
| සිංහල මාධ්‍යය | 1 |
| දෙමළ මාධ්‍යය | 2 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 3 |

11. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 8.0 ශීර්ෂය යටතේ තම **දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්** සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

12. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව **කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.**

13. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර **පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක්** බාරගනු නොලැබේ.

14. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

තිලක් සෙනරත්,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
බස්නාහිර පළාත.

2020 දෙසැම්බර් මස 28 වැනි දින.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම - 2021**

**Recruitment of Bachelor of Education Graduates to Grade II of Class 2 of the Sri Lanka Teachers' Service for Sinhala, Tamil and English Medium Vacancies existing in Western Provincial Schools - 2021**

1.0 පුරප්පාඩුව සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා උපලේඛන 01 භාවිතා කර කේත අංකය යොදන්න. (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

භාෂා මාධ්‍යය : ☐

2.0 අයදුම් කරනු ලබන විෂයය ඡේද අංක 2.3 සඳහන් පරිදි (අකුරෙන්) : ..............................................................................................

..............................................................................................

3.0 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (*උදා* : AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH) :...........

..............................................................................................

3.1 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම :- ..........................................................
(උදා : HERATH A. M. N.)

3.2 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................

..........................................................

3.3 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................

..........................................................

4.0 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : කොළඹ ☐ (අදාළ කොටුව තුළ ✓ යොදන්න.)
කළුතර ☐
ගම්පහ ☐

4.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................

4.2 **2021.02.01** දිනට බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව.- ..........................................................

5.0 අයදුම්කරු රජයේ සේවයේ යෙදී සිටිය දී අයදුම් කරන්නේ නම්,

5.1 දැනට දරන තනතුර :..........................................................

5.2 තනතුරට පත් කළ දිනය :..........................................................

5.3 ආයතන ප්‍රධානියාගේ නිල නාමය :..........................................................

5.4 සේවය කරන ආයතනය :..........................................................

5.5 ආයතනයේ ලිපිනය :..........................................................

6.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

7.0 දුරකථන අංකය : ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐
ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

(මේ සම්බන්ධයෙන් වන තොරතුරු sms පණිවිඩ මඟින් ද ලබා දීමට කටයුතු කරන බැවින් භාවිතයේ පවතින දුරකථන අංකයක් සඳහන් කරන්න.)

8.0 විවාහක/අවිවාහක බව :..........................................................මයා/මිය/මෙය ☐
(කොටුව තුළ අකුරෙන් සඳහන් කරන්න.)

9.0 උපන් දිනය : අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

10.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී/පුරුෂ ☐
(කොටුව තුළ අකුරෙන් ලියන්න.)

11.0 *අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :*

<table>
<tr><td colspan="6">අ.පො.ස. (සා.පෙළ) විභාගය</td><td colspan="2">අ.පො.ස. (උ.පෙළ) විභාගය</td></tr>
<tr><td colspan="6">වර්ෂය :..................... විභාග අංකය :.....................<br>වර්ෂය :..................... විභාග අංකය :.....................</td><td colspan="2">වර්ෂය විභාග අංකය<br>............... .....................</td></tr>
<tr><td>විෂයය</td><td>සාමාර්ථය</td><td>වර්ෂය</td><td>විෂයය</td><td>සාමාර්ථය</td><td>වර්ෂය</td><td>විෂයය</td><td>සාමාර්ථය</td></tr>
<tr><td>1.</td><td></td><td></td><td>6.</td><td></td><td></td><td>1.</td><td></td></tr>
<tr><td>2.</td><td></td><td></td><td>7.</td><td></td><td></td><td>2.</td><td></td></tr>
<tr><td>3.</td><td></td><td></td><td>8.</td><td></td><td></td><td>3.</td><td></td></tr>
<tr><td>4.</td><td></td><td></td><td>9.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>5</td><td></td><td></td><td>10.</td><td></td><td></td><td></td><td></td></tr>
</table>

12.0 *උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :*

12.1 උපාධිය : ...............................................................................................................................................................

12.2 නිකුත් කළ විශ්ව විද්‍යාලය : ..................................................................................................................................

12.3 උපාධිය වලංගු දිනය : .........................................................................................................................................

12.4 උපාධියට හඳුරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් : ......................................................................................................

12.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :.........................................................................................................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :..........................

.............................................
අයදුම්කරුගේ අත්සන.

---

13.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................................ මහතා/මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

.............................................................
අත්සන සහතික කරන නිලධාරිගේ
අත්සන.

දිනය :..........................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :...................................................................................
තනතුර :..................................................................................
ලිපිනය :..................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

---

14.0 *අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ*

.........................................................................................................................මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

..........................................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය ඃ..........................................
තනතුර ඃ.....................................................................................
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ඃ..........................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

01-138

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2021 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2021.01.01 | සිකුරාදා | 2020.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.08 | සිකුරාදා | 2020.12.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.01.15 | සිකුරාදා | 2021.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.22 | සිකුරාදා | 2021.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.29 | සිකුරාදා | 2021.01.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2021.02.05 | සිකුරාදා | 2021.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.12 | සිකුරාදා | 2021.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.19 | සිකුරාදා | 2021.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.25 | බ්‍රහස්පතින්දා | 2021.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2021.03.05 | සිකුරාදා | 2021.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.12 | සිකුරාදා | 2021.02.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.03.19 | සිකුරාදා | 2021.03.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.26 | සිකුරාදා | 2021.03.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.